උපකුලපති කාර්යාලය
කැලණිය විශ්වවිද්‍යාලය

2021.02.08

සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල හවතුන්
සියලුම පරිපාලන හා මූල්‍ය නිලධාරී හවතුන්
සියලුම අධ්‍යයන සහායක හවතුන්
සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩල හවතුන් වෙත,

**කැලණිය විශ්වවිද්‍යාලයේ කොවිඩ් රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා කටයුතු කිරීම**

පසුගිය සති දෙකක කාලය තුළ කොවිඩ් අසාධිතයන් ලෙස හඳුනාගැනෙන විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව ඉහළ යන බව ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් වාර්තා කර ඇත. ඊට සමගාමීව විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් ද කොවිඩ් ආසාධනය වී හඳුනාගෙන ඇති අතර එම සංඛ්‍යාව ද ඉහළ යාමේ ප්‍රවණතාවයක් ඇත. මෙම නව රෝග ව්‍යාප්තිය පිළිබඳව දෛනිකව සමාලෝචනය කරන අතර විශ්වවිද්‍යාල සේවක සහ ශිෂ්‍ය ප්‍රජාවගේ සුබසිද්ධිය සඳහා මේ වන විට විශ්වවිද්‍යාලයට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගෙන ඇත.

කෝවිඩ් රෝගය පාලනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයෙන් හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇතත් රෝග ව්‍යාප්තිය පාලනය සඳහා විශ්වවිද්‍යාල සේවක ප්‍රජාවගේ සහ ශිෂ්‍ය ප්‍රජාවගේ සහයෝගය හා කැපවීම අත්‍යාවශ්‍ය බව ඔබ සියලුදෙනාම දන්නා කරුණකි. **එම නිසා විශ්වවිද්‍යාල සේවක හවතුන් මේ වන විටත් සෞඛ්‍ය අමාත්‍යාංශයයෙන් නිර්දේශ කළ එන්නත් ලබාගෙන නොමැති නම්, නොපමාව එම එන්නත් ලබාගැනීමට යොමුවන** ලෙසත් රාජකාරියේ යෙදෙන අවස්ථාවලදී හා රාජකාරියට පැමිණෙන විට රෝග ව්‍යාප්තිය වැළැක්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාදුන් උපදෙස් අනුව මුව ආවරණ පැළඳීම, සබන් ගා අත් සේදීම, සමාජ දුරස්ථභාවය, කණ්ඩායම් ක්‍රියා වලින් බැහැර වීම වැනි සෞඛ්‍ය මාර්ගෝපදේශ අඛණ්ඩව පවත්වා ගත යුතුය.

එසේම විශ්වවිද්‍යාල සේවක ප්‍රජාව වන ඔබ උණ, ස්වසන ආශ්‍රිත රෝග ලක්ෂණ සහිතව එනම් කෝවිඩ් රෝග ලක්ෂණවලින් පෙළෙන්නේ නම් ඔබගේ සේවා ස්ථානයේ ප්‍රධානියා දැනුවත් කර සේවා ස්ථානයට නොපැමිණ, නොපමාව වෛද්‍ය උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි. එලෙස වෛද්‍ය ප්‍රතිකාර මත නිවසේ රැඳී සිටින්නේ නම් නැවත සේවයට පැමිණෙන විට වෛද්‍ය වාර්තා සමග නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කරන ලෙසට කාරුණිකව දන්වමි.

දෛනික කොවිඩ් රෝගීන් සංඛ්‍යාව වර්ධනය වීම හේතුවෙන් විශ්වවිද්‍යාල නිවෙස් නිරෝධායන මධ්‍යස්ථානය මේවන විට උපරිම ධාරිතාවෙන් ඉක්මවා ගොස් ඇති බවත් ප්‍රධාන වෛද්‍ය නිලධාරී මා වෙත වාර්තා කර ඇත. වෛරස් වසංගතය හමුවේ ඔබගේ වගකීම, කාර්ය මණ්ඩලයේ වගකීම හා සමාජ වගකීම ඉටු කරීම උදෙසා විශ්වවිද්‍යාල ප්‍රජාව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වමි.

Nawasilhe

**උපකුලපති**

**පිටපත්** -
1. සියලුම පීඨාධිපතිවරු
2. සියලුම අංශ ප්‍රධානවරුන්
3. ලේඛකාධිකාරී
4. ප්‍රධාන වෛද්‍ය නිලධාරී